කොත්මලේ ප්‍රාදේශීය සභාව

නුවරඑළිය දිස්ත්‍රික්කය

------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 04 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 29 දින ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කොත්මලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

(අ). සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාළව ලැබිය යුතු රු.3,385,100 ක මුද්දර ගාස්තු, ආදායම් ණයගැතියන් යටතේ දක්වා තිබුණද, වර්ෂයේ ආදායමට ඇතුළත් කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම් රු.3,385,100 අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙසේ ගිණුම් තැබීම නිසා ගිණුම් තුලනය වූ ආකාරයද විගණනයට පැහැදිලි නොවීය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාළ රු.816,560 ක ජල ගාස්තු ආදායම්, මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණු අතර, මෙසේ ගිණුම් තැබීම නිසා ගිණුම් තුලනය වූ ආකාරයද විගණනයට පැහැදිලි නොවීය.

(ඇ). සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 13 දින සභාව ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණු රු.5,000,000 ක ස්ථිර තැන්පතුවට අදාල රු.126,180 ක පොළී ආදායම වසරේ ආදායමට බැර නොකර ආදායම් ණයගැති ගිණුම බැරකර තිබුණු බැවින් වර්ෂයේ පොළී ආදායම එම අගයෙන්ද ආදායම් ණයගැති ශේෂය රු.252,360 ක්ද අඩුවෙන් දැක්වුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු වටිනාකම රු.22,646,698 ක් වුවද, එය රු.26,986,494 ක් ලෙසට රු.4,339,796 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.42,294,421 ක් වුවද එම වටිනාකම ශේෂ පත්‍රයේ රු.42,299,421 ක් ලෙසට රු.5,000ක් වැඩියෙන් දක්වා තිබුණි. මෙසේ ගිණුම් තැබීම නිසා ගිණුම් තුලනය වූ ආකාරයද විගණනයට පැහැදිලි නොවිය.

(ඊ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වියදම් ණය හිමි ගිණුමේ ශේෂය රු.48,626,462 ක් වුවද එම ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු.46,168,111 ක් ලෙස හා කර්මාන්ත ණය හිමි ලේඛනයේ රු.48,697,529 ක් ලෙස දක්වා තිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

-----------------------------

සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු ආදායම මූල්‍ය ප්‍රකාශන අනුව රු.3,638,259 ක් වුවද, වරිපනම් හා බදු ලේඛනය අනුව රු.3,514,994 ක් වූයෙන් රු.123,265 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

(අ). ලැබිය යුතු ගිණුම

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කර්මාන්ත ණයගැති ශේෂය රු.48,176,643 ක් වූ අතර, ඉන් රු.3,637,708 ක් වසරක කාලයක් ඉක්මවා අය නොවී පැවතුණි.

(ආ). ගෙවිය යුතු ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි ශේෂය රු.48,626,462 ක් වූ අතර, ඉන් රු.3,988,337 ක් වසරක කාලයක් ඉක්මවා තිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.

----------------------------------------------------

විගණනය සඳහා අවශ්‍ය හිමිකම් ඔප්පු සහ උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා රු.52,101,113ක ගිණුම් ශේෂ 2 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකිය.

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,420,600 ක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,434,742 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.13,985,858 ක වර්ධනයක් සිදුවී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු. 13,985,858 ක වර්ධනයට ප්‍රධාන වශයෙන් ආදායම් විෂයයන් 2 ක ආදායම් වැඩිවීම හා වියදම් විෂයයක වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

----------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම්වල වටිනාකම රු.75,100,525 ක් සහ ජංගම බැරකම්වල වටිනාකම රු.51,819,950 ක් වූ බැවින් ජංගම අනුපාතය 1.45:1 ක් විය.

2.4 ආදායම් පරිපාලනය

-----------------------

2.4.1 වරිපනම්

-----------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් හා බදු ආදායම රු.1,587,290 ක් වූ අතර, ඉන් රු.652,789 ක් වසරකට අධික කාලයක් අය නොවී පැවතුණි.

2.4.2 බදු කුලී
---------
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කුලී රු.152,722 ක් වූ අතර ඉන් රු.41,472 ක් වසරකට අධික කාලයක් අය නොවී පැවතුණි.

2.4.3 වෙනත් ආදායම්
-------------------
සභා බලප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන ලද මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 2 ක් නියමිත දිනට වැඩ නිම නොකිරීම හේතුවෙන් සභාවට අයවිය යුතු රු.32,164 ක ප්‍රමාද ගාස්තු අයකරගෙන නොතිබුණි.

2.4.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-------------------------------
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,785,750 ක මුද්දර ගාස්තු අයකර ගෙන නොතිබුණි.

2.5 අධිභාර
---------
ප්‍රාදේශීය සභා පනතේ 172 (3) වගන්තියේ සඳහන් විධිවිධාන යටතේ වගකිවයුතු අයවළුන්ට එරෙහිව පනවන ලද අධිභාරවලට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.146,330 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

(අ). හෙල්බොඩ හා මල්දෙණිය උපකාර්යාලවලට අයත් රජයේ නිවාස මනාව නඩත්තුකර නොතිබුණු අතර, ගොඩනැගිලිවල අලුත්වැඩියා කටයුතුද කර නොතිබුණි.

(ආ). හරංගල උපකාර්යාල පරිශ්‍රයේ භූමිය වටා ආරක්ෂිත වැටක් නොමැති වීමෙන් ඇතැම් පුද්ගලයින් විසින් පවත්නා මායිම් වැට වෙනස් කිරීමට උත්සහ දරා තිබුණි.

3.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්
----------------------------------------

(අ). මූල්‍ය ප්‍රකාශනවල රු.534,402 ක පිරිවැයට දක්වා තිබුණු නිසාන් කැරවන් වර්ගයේ ගිලන් රථයක් හා රු.264,113 ක පිරිවැයට දක්වා තිබුණු අත්ට්‍රැක්ටර් 2 ක් වසර 6 කට අධික කාලයක් ධාවනයෙන් ඉවත්කර තිබුණු අතර, අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතුකර නොතිබුණි.

(ආ). මූල්‍ය ප්‍රකාශනවල රු.138,260 ක පිරිවැයට දක්වා තිබුණු ධාවනය කිරීමට සුදුසු තත්වයේ පවතින යතුරු පැදි දෙකක් වසර 1 ½ කට අධික කාලයක් ධාවනයෙන් ඉවත් කර තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------

සභා බලප්‍රදේශය තුළ මාර්ග 3 ක ප්‍රතිසංස්කරණ කටයුතු වලදී මාර්ගවල දෙවනවර තාර යෙදීම මාර්ග තලයේ ගල් විධිමත්ව ආවරණය වන පරිදි කර නොතිබුණි.

3.4 ව්‍යාපෘති ප්‍රමාද කිරීම
------------------------

සභා බලප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජනාකර තිබුණු රඳාගල්බොඩ ජල යෝජනා ක්‍රමය සඳහා 2016 දෙසැම්බර් 31 වන දින මිලදී ගෙන තිබුණු රු.1,897,315 ක් වටිනා ජලනල සහ බෝගහවත්ත කලපිටිය මාර්ගය සංවර්ධනය කිරීමේදී ඉවත් කරන ලද විශ්කම්භය අඟල් 4 ක් වූ විවිධ දිග ප්‍රමාණ වලින් යුතු ජලනල 51 ක්, 2017 මැයි මස 17 වන විටද උපයෝජනය නොකර නිෂ්කාර්යව පැවතුණු අතර, ජල යෝජනා ක්‍රමයේ වැඩ කටයුතුද ආරම්භකර නොතිබුණි.

3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
-----------------------------------

ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ කොස්ගහපතන සහ හපුගස්තලාව කසළ බැහැර කරන ස්ථාන පරීක්ෂාවේදි විධිමත් පරිදි කසළ කළමනාකරණය නොකර එළිමහනේ කසළ දමා තිබුණ අතර, කසළ සමඟ රැගෙන එන පොලිතින් පුළුස්සා දැමීම සිදුකර තිබුණි.

3.6 පාරිසරික ගැටළු
--------------------

ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ හඳුනා ගන්නා ලද අනවසර ඉදිකිරීම් 96 ක් වූ අතර, ඒවා සම්බන්ධයෙන් 2017 මැයි 02 දිනවන විටද සුදුසු ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

අයවැය පාලනය
-------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 11 සිට සියයට 118 ක් දක්වාද, වියදම් විෂයයන් 06 ක සියයට 12 සිට සියයට 83 ක් දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනය
-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ). | ආදායම් පරිපාලනය. | සභාවට ලැබිය යුතු හිඟ ආදායම් අයකරගෙන නොතිබීම. |
| (ආ). | ණයගැති/ ණයහිමි පාලනය. | ලැබිය යුතු මුදල් නිරවුල්කර ගැනීම සහ ගෙවිය යුතු ගෙවීම් නිරවුල් කර නොතිබීම. |
| (ඇ). | ගිණුම්කරණය. | ගිණුම් වර්ෂයට අදාළ වත්කම් සහ බැරකම් ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීමේදී විවිධ අඩුපාඩු සිදුවී තිබීම. |